

(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 193.]

පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

2026 නොවැම්බර් 03 අඟහරුවාදා පූ.භා. 9.30 ට

වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

1195/2025

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය දිස්ත්‍රික්කයේ, ඩෙල්ෆ්ට් දූපතේ පිහිටි පාසල් භෞතික සම්පත් ඌනතාවයකින් සහ කාර්ය මණ්ඩල පුරප්පාඩු සහිතව ක්‍රියාත්මක වන බව දන්නේද;

(ii) එම ප්‍රදේශයේ පිහිටි යා/ඩෙල්ෆ්ට් මහා විද්‍යාලය අයත් වන පාසල් වර්ගීකරණය කවරේද;

(iii) එම පාසලේ ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iv) පාසලේ විදුහල්පති, ගුරුවරුන් සහ අනධ්‍යයන සේවකයන් ඇතුළු අනුමත කාර්ය මණ්ඩලය කොපමණද;

(v) මේ වනවිට සේවයේ නියුතු කාර්ය මණ්ඩලය කොපමණද;

(vi) මේ දක්වා කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ නොකිරීමට බලපා ඇති හේතු කවරේද;

(vii) එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අවශ්‍ය කාලසීමාව කොපමණද;

(viii) ගුරු පුරප්පාඩු හේතුවෙන් එම පාසලේ සිසුන් මුහුණදී සිටින ගැටලු කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1574/2025

ගරු තුරෙරාසා රවිකරන් මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ, තිරුමුරිකණ්ඩි පිල්ලෙයාර් කෝවිල (ගණදෙවි දේවාලය) ඉදිරියේ ඇති ජනාවාස පිටුපස පිහිටි වනාන්තරය රක්ෂිත ප්‍රදේශයක් බවත්;

(ii) 2010 වර්ෂයෙන් පසු එම රක්ෂිතය තුළ වන විනාශයක් සිදුකර ඉදිකිරීම් කර ඇති බවත්;

(iii) එම රක්ෂිතය මෙතෙක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පරිපාලනයෙන් නිදහස් කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත රක්ෂිතයේ නම කවරේද;

(ii) එම වනාන්තර ප්‍රදේශය රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත් කළ ගැසට් පත්‍රයේ දිනය සහ අංකය කවරේද;

(iii) රක්ෂිතය තුළ සිදුකරන ලද ගස් කැපීම සඳහා පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවක් ලබාගෙන තිබේද;

(iv) රාජ්‍ය දැව සංස්ථාවේ නිලධාරීන් විසින් එම ගස් කැපීම සිදුකර ඇත්තේ නීත්‍යානුකූල අනුමැතියක් යටතේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1684/2025

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කින්නියා ප්‍රදේශයේ ජනගහනය සහ ජල පාරිභෝගිකයින් සංඛ්‍යාවට සාපේක්ෂව, එම ප්‍රදේශයේ පිහිටි ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කාර්යාලය ප්‍රමාණවත් නොවන බවත්;

(ii) එම කාර්යාලයට ලබාදී ඇති වාහනය භාවිතයට ගත නොහැකි තත්ත්වයක පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මණ්ඩලයේ කින්නියා කාර්යාලය මඟින් නඩත්තු වන පානීය ජල සැපයුම් ලබාදී ඇති පාරිභෝගිකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම කාර්යාලය වෙනුවට, පහසුකම් සහිත නව කාර්යාලයක් ස්ථාපිත කිරීමට පියවර ගන්නේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iv) කින්නියා ප්‍රදේශයේ නව ජල සම්බන්ධතා සඳහා ඉල්ලුම් කරන පුද්ගලයින් සංඛ්‍යාව ඉහළ ගොස් ඇති බැවින් නව පොදු ජල සම්බන්ධතා පුළුල් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1827/2026

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ වර්ෂයකට මාර්ග අනතුරු හේතුවෙන් සිදුවන මරණ සංඛ්‍යාවෙහි සහ තුවාල ලබන සංඛ්‍යාවෙහි සාමාන්‍යය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම අනතුරු හේතුවෙන් තාවකාලිකව සහ ස්ථිරව ආබාධිත තත්ත්වයට පත්වන පුද්ගලයින් සංඛ්‍යාවෙහි සාමාන්‍යය කොපමණද;

(iii) අනතුරුවලට ලක්වූවන් සඳහා වර්ෂයකට වෙන් කරනු ලබන ඇඳන් සංඛ්‍යාවෙහි සහ ඇඳන් භාවිතා කරන දින ගණනෙහි සාමාන්‍යය කොපමණද;

(iv) මාර්ග අනතුරුවලට ලක්වූවන් සඳහා ප්‍රතිකාර ලබාදීම සඳහා වර්ෂයකට වැයවන ආසන්න වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

2126/2026

ගරු දේවානන්ද සුරවීර මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බස්නාහිර පළාතේ, විවිධ සේවා සමුපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

(ii) එම සමිති, සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කර තිබේද;

(iii) නොඑසේ නම්, ලියාපදිංචිවී නොමැති සමුපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

(iv) පළාත තුළ ඇති ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමනයට යටත් සහ තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයට ඇතුළත් සහ ඇතුළත් නොවූ සමුපකාර බැංකු සංඛ්‍යාව කොපමණද;

(v) 2025.12.31 දිනට පළාත තුළ පවතින සමුපකාර බැංකුවල තැන්පත්කරුවන් සංඛ්‍යාව සහ තැන්පතු ප්‍රමාණය කොපමණද;

(vi) එදිනට තැන්පත්කරුවන්ගේ මුදල් ආපසු ගෙවීම පැහැර හැර ඇති සමුපකාර බැංකු සංඛ්‍යාව සහ මුදල් ප්‍රමාණය කොපමණද;

(vii) එම බැංකුවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) තැන්පතු සහ ණය ආපසු ලබාගැනීම සඳහා කඩිනම් ක්‍රමවේද සකස් කර තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රමවේද කවරේද;

(iii) ලියාපදිංචි නොවූ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමනයට යටත් නොවන සමුපකාර සමිති සහ එම සමිතිවල දූෂණ සහ අක්‍රමිකතා සිදු කළ කළමනාකාරිත්වයට එරෙහිව ගනු ලබන නීතිමය ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

2164/2026

ගරු නීතිඥ සරත් කුමාර මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'ගල්ඔය නිම්න ජාතික වනෝද්‍යානය' ජාතික වනෝද්‍යානයක් ලෙස ප්‍රකාශයට පත් කරමින් ගැසට් නිවේදනය නිකුත් කළ වර්ෂය කවරේද;

(ii) එම වනෝද්‍යානය අයත් වන පරිපාලන දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(iii) වනෝද්‍යානයේ මුළු භූමි ප්‍රමාණය කොපමණද;

(iv) මොනරාගල දිස්ත්‍රික්කයේ, මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් බදුලුවෙල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පිහිටි, වනෝද්‍යානයේ සීමාව තුළ වගා කටයුතු සඳහා නීත්‍යානුකූලව අවසර ලබාදී තිබේද;

(v) එසේ නම්, වගා කටයුතු සඳහා වෙන් කර ඇති භූමි ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම වනෝද්‍යානයට අයත් මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බදුලුවෙල ප්‍රදේශයේ රක්ෂිත සීමා තුළ ස්ථිර නිවාස හෝ වෙනත් ගොඩනැගිලි ඉදිකර තිබේද;

(ii) එසේ නම්, එම රක්ෂිත සීමා තුළ මේ වනවිට පදිංචිව සිටින පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම පදිංචිකරුවන් සහ වගාකරුවන් සම්බන්ධ නීතිමය තත්ත්වය කවරේද;

(iv) එම ජනතාවගේ ගැටලු විසඳීමට ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

2198/2026

ගරු ජේ.සී. අලවතුවල මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයට බඳවා ගැනීමේ ක්‍රමවේදය කවරේද;

(ii) එම සේවය සඳහා අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වනවිට එම සේවයේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iv) එක් එක් රාජ්‍ය ආයතන තුළ මෙම සේවය සඳහා අනුමත කර ඇති තනතුරු නාම කවරේද;

(v) එම සේවයේ පවතින පුරප්පාඩු හේතුවෙන් අදාළ තනතුරුවල රාජකාරි ආවරණය කිරීම සඳහා වෙනත් සේවාවල නිලධාරීන් පත් කර තිබේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

(vi) මෙම සේවයේ පවතින පුරප්පාඩු සහ අනෙකුත් ගැටලු විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

2275/2026

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා,— ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ සිටින ආබාධිත පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පුද්ගලයන් සංඛ්‍යාව ආබාධිතභාවයේ ස්වභාවය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ආබාධිත පුද්ගලයන්ගේ සුබසාධනය සඳහා රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

2381/2026

ගරු සුනිල් රාජපක්ෂ මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදේශ රැකියාවක් සඳහා පිටත්ව ගිය ශ්‍රී ලාංකික ශ්‍රමිකයකු ගිවිසුම්ගත සේවා ස්ථානයේ සේවයේ නියුතු බව තහවුරු කිරීම සඳහා ක්‍රියාත්මක කර ඇති පසු විපරම් ක්‍රමවේදය කවරේද;

(ii) ශ්‍රමිකයෙකු විදේශගත වීමෙන් පසු ශ්‍රී ලංකාවේ සිටින තම ඥාතීන් සමඟ සබඳතා පවත්වාගෙන යන බව තහවුරු කිරීම සඳහා ක්‍රියාත්මක කර ඇති වැඩපිළිවෙළ කවරේද;

(iii) විදේශ ශ්‍රමිකයන්ට නියමිත දිනට නියමිත වැටුප ලැබෙන බවත්, උචිත නවාතැන්, ආහාර සහ ශීත ඇඳුම් ඇතුළු අවශ්‍ය පහසුකම් ලැබෙන බවත් තහවුරු කරනු ලබන ආකාරය කවරේද;

(iv) එම ශ්‍රමිකයන්ගේ කායික සහ මානසික සුරක්ෂිතභාවය තහවුරු කරනු ලබන ආකාරය කවරේද;

(v) විදේශ ශ්‍රමිකයන් ගිවිසුම් කාලය අවසානයේදී ශ්‍රී ලංකාවට පැමිණෙන්නේද, නැතහොත් ගිවිසුම් කාලය දීර්ඝ කරගන්නේද යන්න පිළිබඳ නියාමන ක්‍රමවේදයක් පවත්වාගෙන යනු ලබන්නේද;

(vi) විදේශ රැකියා කාලසීමාව තුළ එම ශ්‍රමිකයාගේ කලත්‍රයා සහ දරුවන්ගේ සුරක්ෂිතභාවය සහ සුබසාධනය වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

2484/2026

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විවිධ වෘත්තීන්වලට බඳවාගන්නා ලද ත්‍රිවිධ හමුදා නිලධාරින් සහ සෙසු නිලයන් සේවය අතහැර යාමේ ප්‍රවණතාවක් පවතින්නේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

(iii) සේවය හැර ගොස් විදේශගතව සිට මෙරටට පැමිණීමේදී අත්අඩංගුවට ගනු ලබන හෝ භාරවන නිලධාරින්ට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iv) සේවය හැර ගොස් විදේශගතව සිටින නිලධාරින්ට නැවත සේවයට එක්වීමේ හැකියාවක් තිබේද;

(v) නොඑසේ නම්, ඒ මන්ද;

(vi) සේවයෙන් ඉවත් වීමට ඉල්ලුම් කරන නිලධාරියෙකුගේ ඉල්ලීම සම්පූර්ණ කිරීමට ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රාජ්‍ය සේවකයන්ගේ වර්ෂ 05ක විදේශ නිවාඩු ක්‍රමවේදයට ත්‍රිවිධ හමුදා සාමාජිකයන් ඇතුළත් කර තිබේද;

(ii) නොඑසේ නම්, ඒ මන්ද;

(iii) එම ක්‍රමවේදය යටතේ විදේශ නිවාඩු ලබාගත් ත්‍රිවිධ හමුදා සාමාජිකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම විදේශ නිවාඩු පසුව අවලංගු කර තිබේ නම්, ඒ සඳහා හේතු කවරේද;

(v) සේවය හැරගිය ඉහත (අ)(i)හි සඳහන් පුද්ගලයින්ට පොදු සමා කාලයක් ලබා නොදීමට සහ පසුගිය පොදු සමා කාලයන්ට ඇතුළත් නොකිරීමට හේතු වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා,— සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන),— (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

යෝජනා පිළිබඳ දැනුම්දීම

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. පූ.භා. 11.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

1.

පා.136/2026

ගරු තනුර දිසානායක මහතා
ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය
ගරු ගයාන් ජනක මහතා
ගරු නීතිඥ සුනිල් වටගල මහතා
ගරු ගමගෙදර දිසානායක මහතා
ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා
ගරු ජනිත රුවන් කොඩිතුවක්කු මහතා
ගරු චමින්ද ලලිත් කුමාර මහතා
ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය
ගරු එරංග වීරරත්න මහතා
ගරු මුනීර් මුලාෆර් මහතා
ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා
ගරු ලසිත් භාෂණ ගමගේ මහතා
ගරු කිට්නන් සෙල්වරාජ් මහතා
ගරු වන්දන සූරියආරච්චි මහතා
ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා
ගරු ජගත් මනුවර්ණ මහතා
ගරු දීප්ති වාසලගේ මහත්මිය

ගරු කංචන වැලිපිටිය මහතා
ගරු ආර්.ජී. විජේරත්න මහතා
ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය
ගරු මුහම්මද් ෆයිසාල් මහතා
ගරු සුනිල් බියන්විල මහතා
ගරු වන්දිම හෙට්ටිආරච්චි මහතා
ගරු මංජුල සුගත් රත්නායක මහතා
ගරු අරුණ පනාගොඩ මහතා
ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා
ගරු රොෂාන් අක්මීමන මහතා
ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා
ගරු සුගත් තිලකරත්න මහතා
ගරු නන්ද බණ්ඩාර මහතා
ගරු වසන්ත පුෂ්ප කුමාර මහතා
ගරු අසෝක සපුමල් රන්වල මහතා
ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා
ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා
ගරු නිශාන්ත පෙරේරා මහතා
ගරු කේ. ඉලංකුමාරන් මහතා
ගරු ආනන්ද විජේපාල මහතා
ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා
ගරු කන්දසාමි ප්‍රභු මහතා
ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා
ගරු ෆස්මින් ෂරීෆ් මහතා
ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා
ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා
ගරු එරංග ගුණසේකර මහතා
ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මහතා
ගරු සංජීව රණසිංහ මහතා
ගරු රියාස් ෆාරූක් මහතා
ගරු සුදත් බලගල්ල මහතා
ගරු ඊ.එම්. බස්නායක මහතා

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා,— 1983 කළු ජූලි බෛදනීය සිදුවීම හා එහි බලපෑම පිළිබඳව පූර්ණ අධ්‍යයනයක් සිදු කර වාර්තා කිරීමටත්, ජාතික සහජීවනය තහවුරු කිරීම සහ පීඩාවට පත් පිරිස් වෙත සහන සැලසීම පිළිබඳ සිය යෝජනා සහ නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,— 1983 වසරේ දී සිදු වූ කළු ජූලිය හේතුවෙන් දශක කිහිපයක් තිස්සේ රටක් ලෙස ආර්ථික, සමාජීය, සංස්කෘතික වශයෙන් ආපස්සට ඇද දමන ලදුව, ඒ හේතුවෙන් වටිනා ජීවිත දහස් ගණනක් අහිමි වූ අතර දැවැන්ත දේපළ හානියක් ද සිදු වූ අතර ආර්ථික වශයෙන් ද දැවැන්ත පසුබෑමකට ලක් වූ හෙයින් ද;

එම භෞතික හානියට වඩා රටට සිදු වූ බරපතලම සහ විනාශකාරී හානිය වන්නේ ජන කොටස් අතර නොසන්සුන්තාවය, බිය හා සැකය වර්ධනය වීම හෙයින් ද;

ශ්‍රී ලංකා ඉතිහාසයේ දරුණුතම භේදවාචකයක් ලෙස සැලකෙන 1983 කළු ජූලි සිදුවීමෙන් සිදු වූ ජීවිත හානි, දේපළ හානි හා ජනතාවට සිදුව ඇති මානසික හා සාමාජීය හානිය මෙතෙක් නිසි ලෙස තක්සේරු කර නොමැති හෙයින් ද;

මෙවැනි ජාතිවාදී හා අර්බුදකාරී සිදුවීම් අනාගතයේ දී නැවත සිදුවීම වළක්වා ගැනීම සඳහා ශක්තිමත් නීතිමය, සාමාජීය හා සංහිඳියා යාන්ත්‍රණයක් සකස් කිරීමේ අවශ්‍යතාව මතු වී ඇති හෙයින් ද;

ශ්‍රී ලංකාව තුළ විවිධ ජාතීන් අතර පවතින විශ්වාසය සහ සුහදතාවය බිඳ වැටෙන ආකාරයේ ක්‍රියාකාරකම් වළක්වා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීම අත්‍යවශ්‍ය කරුණක් බවට පත්ව තිබෙන හෙයින් ද;

එම සිදුවීම සඳහා හේතු සාධක වූ කරුණු සහ එම විනාශකාරී ක්‍රියාවන් මෙහෙය වූ පුද්ගලයින් ආනාවරණය කරගත යුතු හෙයින් ද;

එම සිදුවීමෙන් පීඩාවට පත් සහ අගතියට පත් වූ සමස්ත ජනතාවගේ සිත් පැදීම උදෙසා සහ ඔවුන් වෙත යම් කිසි සාධාරණ සහනයක් හෝ ගෞරවනීය සුවපත් කිරීමේ පියවර ලබාදීම රාජ්‍යයක වගකීමක් වන හෙයින් ද;

1983 කළු ජූලි භේදනීය සිදුවීම් හා එහි බලපෑම පිළිබඳව පූර්ණ අධ්‍යයනයක් සිදු කර වාර්තා කිරීමටත්, ජාතික සහජීවනය තහවුරු කිරීම සහ පීඩාවට පත් පිරිස් වෙත සහන සැලසීම පිළිබඳ සිය යෝජනා සහ නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කර සිටියි.

2. (අ) කථානායකවරයා විසින් කාරක සභාවෙහි සභාපතිවරයා සහ සාමාජික මන්ත්‍රීවරයන් නම් කළ යුතු ය; සහ

(ආ) පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 101 හි විධිවිධාන ප්‍රකාරව කාරක සභාව සාමාජික මන්ත්‍රීවරයන් දොළොස් දෙනෙකුට (12) නොවැඩි විය යුතු ය.

3. එම කාරක සභාවට —

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් පුළුල් අධ්‍යයනයක් සිදු කිරීම සඳහා කාරක සභාව විසින් අවශ්‍ය යැයි තීරණය කරනු ලබන පරිදි, ඕනෑම තැනැත්තෙකු එම කාරක සභාව ඉදිරියට කැඳවීමට ද, ඕනෑම ලියවිල්ලක් හෝ වාර්තාවක් ලබා දෙන ලෙසට ඕනෑම තැනැත්තෙකුට නියම කිරීමට ද, එකී සියලු සාක්ෂි ලිඛිතව හෝ වාචිකව, ලබා ගැනීමට ද;

(ඇ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට ද; සහ

(ඈ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද පාර්ලිමේන්තුව කල් තබනු ලැබ හෝ වාරාවසාන කරනු ලැබ තිබුණ ද රැස්වීම් පවත්වාගෙන යාමට ද,

බලය තිබිය යුතු ය.

4. කාරක සභාවේ වාර්තාව එහි පළමු රැස්වීමේ දින සිට මාස හයක (06) කාලයක් හෝ පාර්ලිමේන්තුව විසින් දීර්ඝ කරනු ලබන එවැනි කාල පරිච්ඡේදයක් ඇතුළත දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

*2.

ජලභීතිකා රෝගය තුරන් කිරීමේ සහ සුනඛයන් ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබන ලද ප්‍රශ්නය. (2026 ඔක්තෝබර් 23) [1].

*3.

ශ්‍රී ලංකා ක්‍රිකට් පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

ආගමන පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

විසර්ජන පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

විදේශීය ත්‍රස්තවාදී සටන්කරුවන් වැළැක්වීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

සංවිධානාත්මක අපරාධ වැළැක්වීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා,— උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2022),— 1987 අංක 50 දරන උපරිමාධිකරණ සංකීර්ණය කළමනාකරණ මණ්ඩල පනතේ 11(2) වගන්තිය යටතේ 2023.11.22 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.18 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.03 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*11.

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා,— අපරාධයක විත්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ වාර්ෂික වාර්තාව (2022),— 2023 අංක 10 දරන අපරාධයක විත්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ 93(2) වගන්තිය යටතේ 2024.02.20 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අපරාධයක විත්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.18 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.03 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*12.

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා,— අපරාධයක විත්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ වාර්ෂික වාර්තාව (2023),— 2023 අංක 10 දරන අපරාධයක විත්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ 93(2) වගන්තිය යටතේ 2025.08.07 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අපරාධයක විත්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.18 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.03 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*13.

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාතුමා,— ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව (2022),— ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 27 දරන නීති ආධාර පනතේ 24(2) වගන්තිය යටතේ 2024.06.19 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.18 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.03 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*14.

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාතුමා,— ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව (2023),— ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 27 දරන නීති ආධාර පනතේ 24(2) වගන්තිය යටතේ 2025.08.19 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.18 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.03 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*15.

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාතුමා,— රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව (2020),— 1991 අංක 18 දරන රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනතේ 32 වගන්තිය යටතේ 2023.07.05 දින ඉදිරිපත් කරන ලද, 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.04.26 සහ 2025.11.18 යන දිනයන්හි දී සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.03 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*16.

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාතුමා,— රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව (2021),— 1991 අංක 18 දරන රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනතේ 32 වගන්තිය යටතේ 2024.01.09 දින ඉදිරිපත් කරන ලද, 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.04.26 සහ 2025.11.18 යන දිනයන්හි දී සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.03 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*17.

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා,— රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව (2022),— 1991 අංක 18 දරන රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනතේ 32 වගන්තිය යටතේ 2024.06.04 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.18 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.03 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*18.

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා,— රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව (2023),— 1991 අංක 18 දරන රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනතේ 32 වගන්තිය යටතේ 2025.06.20 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.18 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.03 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*19.

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා,— ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ වාර්ෂික වාර්තාව (2022),— 2007 අංක 26 දරන ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය පනතේ 23 වගන්තිය යටතේ 2024.07.24 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.18 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.03 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*20.

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා,— ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ වාර්ෂික වාර්තාව (2023),— 2007 අංක 26 දරන ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය පනතේ 23 වගන්තිය යටතේ 2025.10.10 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.18 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.03 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*21.

පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*22.

ගෙවල් කුලී (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*23.

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබන ලද ප්‍රශ්නය. (2025 සැප්තැම්බර් 24) [1].

*24.

විදුලිසංදේශ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*25.

මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*26.

බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරික්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2025 අප්‍රේල් 10),— "2025 මාර්තු 14 දින පාර්ලිමේන්තුවේ දී සභාගත කරන ලද බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරික්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුව විසින් සලකා බලනු ලැබිය යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

27.

පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

28.

ශ්‍රී ලංකා පහසුකම් කළමනාකරණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

29.

ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

30.

කෝදාගොඩ ගුණරතන නාහිමි පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

31.

යූඑන්වී පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

[1]

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

1.

2452/2026

ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) 2020.01.01 දින සිට 2026.06.30 දින දක්වා අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඊට අනුබද්ධ ආයතන මඟින් විදේශීය ණය හෝ ප්‍රදාන යටතේ ක්‍රියාත්මක කළ හෝ ක්‍රියාත්මක කරනු ලබන එක් එක් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් —

(i) ව්‍යාපෘතියේ නම හා ණය ලබාදෙනු ලබන ආයතනයේ ව්‍යාපෘති අංකය;

(ii) අරමුදල් සපයන විදේශීය ආයතනය හෝ රාජ්‍යය;

(iii) අදාළ ගිවිසුම් අංක, අත්සන් කළ දින හා ක්‍රියාත්මකවූ දිනයන්;

(iv) මුළු පිරිවැය, විදේශීය අරමුදල් ප්‍රමාණය හා රාජ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය;

(v) අදාළ පොලී අනුපාතය, සහන කාලය හා ආපසු ගෙවීමේ කාලය;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2026 ජුනි 30 දිනට එක් එක් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් —

(i) වෙන් කළ මුදලින් වියදම් කර ඇති මුදල හා එහි ප්‍රතිශතය;

(ii) භෞතික ප්‍රගතිය ප්‍රතිශතයක් වශයෙන්;

(iii) මුල් සැලසුමට අනුව අපේක්ෂිත ප්‍රගතිය සහ සැබෑ ප්‍රගතිය අතර වෙනස;

(iv) සිදුවී ඇති ප්‍රමාදය;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

2453/2026

ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ නිකුත් කළ පෙළ පොත් සහ විෂය මොඩියුල මුද්‍රණය සඳහා විදේශීය අරමුදල් යොදාගෙන තිබේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතියේ නම සහ අරමුදල් සපයන ආයතනය හෝ රාජ්‍යය කවරේද;

(iii) එම අරමුදල් ණයක් හෝ ප්‍රදානයක් ලෙස ලබාගෙන තිබේද;

(iv) ව්‍යාපෘති කාලසීමාව සහ මුද්‍රණය සඳහා වෙන් කළ මුළු අරමුදල් ප්‍රමාණය කවරේද;

(v) 2026.06.30 දිනට එයින් වියදම් කර ඇති මුදල කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දෝෂ හේතුවෙන් බෙදාහැරීම නවතා දැමීමට හෝ ඉවත් කිරීමට සිදුවූ පිටපත් සංඛ්‍යාව ශ්‍රේණිය, විෂය සහ මාධ්‍ය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එමඟින් රජයට සිදුවූ මූල්‍ය අලාභය කොපමණද;

(iii) නැවත මුද්‍රණය කළ පිටපත් සංඛ්‍යාව, ඒ සඳහා වැයවූ මුදල සහ එම මුදල් ලබාගත් මූලාශ්‍රය කවරේද;

(iv) මේ සම්බන්ධයෙන් පවත්වන ලද විර්මශනවල නිගමන කවරේද;

(v) වගකිවයුතු පාර්ශ්ව වෙතින් එම අලාභය අයකර ගැනීමට පියවර ගෙන තිබේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

2454/2026

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය ගෘහස්ථ ක්‍රීඩාංගනයේ ඉදිකිරීම් ආරම්භ කර තිබේද;

(ii) එසේ නම්, ඉදිකිරීම් ආරම්භ කළ දිනය කවරේද;

(iii) ඒ සඳහා වෙන් කළ මුළු ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(iv) කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළ ක්‍රමවේදය කවරේද;

(v) ඉදිකිරීම් භාර දුන් කොන්ත්‍රාත්කරු කවුරුන්ද;

(vi) එම කොන්ත්‍රාත්තුවේ ගිවිසුම්ගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතිය සඳහා මේ දක්වා දරන ලද වියදම සහ භෞතික ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස කවරේද;

(ii) ඇස්තමේන්තුගත මුදල ඉක්මවා වියදම් කර තිබේ නම්, එම ප්‍රමාණය සහ එයට හේතු කවරේද;

(iii) 2026 වර්ෂය සඳහා අවශ්‍ය ඉතිරි ප්‍රතිපාදන සහ ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම කිරීමට නියමිත දිනය කවරේද;

(iv) වාර්ෂික නඩත්තු හා මෙහෙයුම් පිරිවැය ලෙස ඇස්තමේන්තු කර ඇති මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?